


# කළිඳු වීරසිංහ

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

මෙල්බන් නගරයේ සීතලෙන් මිදෙන්න ගෙදර ඉඳන් පැරණි වීඩියෝ පටයක් නරඹමින් හිටියා. කලකට පෙර ජනප්‍රියව තිබූ රූපවාහිනී වැඩසටහනක් වූ නඳුන් උයන රූපවාහිනී තිරය මත දිගහැරුණා. අපූරු තරුණ ගායකයෙක් ගීතයක් ගායනා කරමින් එම ගීතයට රූප රචනයෙන් ද දායක වෙලා සිටිය හැටි මම දැක්කා. ගීතය රචනා කර තිබුණේ බන්දුල නානායක්කාරවසම් සංගීතය නිර්මාණය කරනු ලැබුවේ රෝහණ වීරසිංහ ගීතය ගායනා කරපු අපූරු කඩවසම් තරුණයා කළිඳු වීරසිංහ. මේ වැඩසටහන නරඹන අතරේ මට හිතුණා මේ මාසයේ මුහුණට මුහුණ කළිඳුට වෙන් කරන්න.

කළිඳු මේ දවස් වල ඔහුගේ උපාධියේ අවසන් පරීක්ෂණ නිම කරලා වෙනත් ආකාරයේ වැඩකට වෙහෙසෙ වෙමින් ඉන්නවා. ඒ නිසා කතාවට අල්ලා ගන්නත් අමාරු තරම්. ඒත් සනන්ස වෙනුවෙන් විනාඩි කීපයක් ඔහු වෙන් කළා.

**ශ්‍රීනාත්**
මොකද මේ හදිස්සියේ දුවන්නෙ..?
**කළිඳු**
මේ දවස් වල බර වැඩකට අතගහලනෙ ඉන්නෙ. මම ලංකාවේ අති දක්ෂ ගායක ගායිකාවන් පිරිසක් ඔස්ට්‍රේලියාවට ගෙන්නලා අලුත් ආකා රයේ සංගීත ප්‍රසංගයක් කරන්න මේ දවස්වල මහන්සි වෙනවා. සරස වසන්තය මේ ප්‍රසංගයේ නමයි.

**ශ්‍රීනාත්**
මේ සංගීත ප්‍රසංගයේ මොකක් හරි විශේෂත්වයක් තියෙනවා?
**කළිඳු**
ඔව්.. ලොකු විශේෂත්වයක් තියෙනවා.. ඒ තමයි හැමෝගෙම ආදරය දිනාගත් සෝමතිලක ජයමහ ගායන ශිල්පියා පළමු වරට විදේශ සංචාරයකට එක්වෙමින් ඔස්ට්‍රේලියාවෙට පැමිණීම. ඒ ඇරෙන්න දයාන් විතාරණ දීපිකා ප්‍රියදර්ශණී ගායනයෙන් ද සුරේශ් මාලියද්ද තිස්සසිරි පෙරේරා මහේන්ද්‍ර පැස්කුවෙල් ජානක බෝගොඩ යන සංගීත ශිල්පීන් සමගින් සංගීතය මෙහෙයවන්නට මගේ දයාබර පියාණන් වන රෝහණ වීරසිංහයන්ද මෙහි පැමිණෙනවා.

**ශ්‍රීනාත්**
කවදද කළිඳු ප්‍රසංගය?
**කළිඳු**
ඔක්තෝබර් 14 වනදින සවස 5 ට මොනෑෂ් විශ්ව විද්‍යාලයේ රොබට් බ්ලැක්වුඩ් ශාලාවේ දීත් ඔක්තෝබර් 20 වන දින සවස 5 ට සිඩ්නි පැරමටා හි වෙස්ටර්න් සිඩ්නි විශ්ව විද්‍යාලයේ S Sir Ian Turbott ශාලාවේදීත් මේ ප්‍රසංගය පැවැත්වෙනවා.
**ශ්‍රීනාත්**
අර නඳුන් උයනේ ගීතය ගැන යමක් කතා කරමුද?
**කළිඳු**
මේක රූ ගත කළේ 1998. මේකට හේතු වුණේ සමස්තක ලංකා ගායනා තරගයෙන් මම පළමුවැනියා වීම. ඒ නිසා මේ වැඩ සටහනේ ගීතයක් ගායනා කරන්න මට ආරාධනා ලැබුණා.

**ශ්‍රීනාත්**
ඇයි ගීත ගායනා කිරීම දැන් දිගටම කරන්නෙ නැත්තෙ?
**කළිඳු**
මම ගායනයට වඩා තනු නිර්මාණ පැත්තට වැඩි කැමැත්තක් තියෙනවා.

**ශ්‍රීනාත්**
ඒ කියන්නෙ ගායනය අත්හැරලද?
**කළිඳු**
නෑ .. එහෙමමත් නෑ..
බලාපොරොත්තුවක් තියෙනවා අලුත් ගීත කීපයක් කරන්නත්.. හැබැයි ඒකට මූලිකත්වය දෙන්නෙ නෑ..

**ශ්‍රීනාත්**
ඔබගේ චාමිං කබි බෑන්ඩ් එකට මොක වුණේ?
**කළිඳු**
ශ්‍රීනාත් අයියට ඒකත් මතකද?

**ශ්‍රීනාත්**
ඇයි අමතක? ඒ කාලේ ඒක ඉතාමත් ජනප්‍රිය වුණා නෙ
**කළිඳු**
අපි ක්ට්ටිය ඒ කිව්වෙ සංඛ එදිරිසිංහ විහඟ විජේසේකර එකතු වෙලා අවුරුදු 14 - 15 කාලෙදි අපි සංගීත කණ්ඩායමක් හදා ගත්තා.. ඒකෙ කී බෝඩ් වාදනය කළේ මම.. නමුත් 1999 වැඩිදුර අධ්‍යාපනය සඳහා ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙ ඒක පවත්වගෙන යන්න බැරි වුණා.

**ශ්‍රීනාත්**
ඔබේ පාසල් කාලය ගැන මතක් කළොත්
**කළිඳු**
මම මුලින්ම පාසල් ගියේ කොළඹ අශෝක කණිෂ්ඨෛටඩඩ එතනින් ආනන්ද විද්‍යාලෙට..

**ශ්‍රීනාත්**
මුල්ම සංගීත ගුරුවරයා කව්ද?
**කළිඳු**
මට මුලින් සංගීතය ඉගැන්නුවේ ලෙස්ලි විජේවික්‍රම මහත්තයා. ඊට පස්සෙ ඉන්දියානු සංගීතය කෝලිත භානු දිසානායක මහතාගෙන් ඉගෙනගත්තා. ගෙදර පරිසරයත් මගේ හැකියාවන් වර්ධනය වෙන්න ඉවහල් වෙන්න ඇති.

**ශ්‍රීනාත්**
මුලින්ම තනුවක් නිර්මාණය කළේ කාටද?
**කළිඳු**
මම මුලින්ම තනුවක් නිර්මාණය කළේ දර්ශණා වික්‍රමතුංග කියන ගායන ශිල්පියාට. ඉන් පස්සෙ නන්දා මාලිනී මහත්මිය රෝහණ කරුණාරත්න සෙව්න්දිකා අබේරත්න ශිරෝමා ප්‍රනාන්දු හේමන්ත වඩස් නෙලූ අදිකාරි වැනි ගායක ගායිකාවන්ට තනු නිර්මාණය කලා.

**ශ්‍රීනාත්**
නව පරපුරේ සංගීත ශිල්පීන් ගැන ඔබගේ අදහස කුමක් ද?
**කළිඳු**
අලුත් දෙයක් කරන සහ අලුත් දෙයක් කරන්න උතාසහ කරන ශිල්පීන්ට මගේ කැමැත්තක් තියෙනවා. ඒ වගේම අපේ හිටපු කලා ශිල්පීන් ගේ දේ රැගෙන ඒවා විනාශ කරන්න හා විකෘති කරන්න යන අයට මගේ කැමැත්තක් නැහැ. එක තැනම පල් වෙන්නෙ නැතිව අලුත් ඇහැකින් බලන්නට යන ශිල්පීන්ට මම කැමතියි.

**ශ්‍රීනාත්**
පවුලේ විස්තර ටිකක් කියමුද?
**කළිඳු**
මගේ පියා රෝහණ වීරසිංහ මව බියට්‍රිස් වීරසිංහ මල්ලි චිරන්ත

**ශ්‍රීනාත්**
ඔබේ සහකාරිය..?
**කළිඳු**
ඇගේ නම චලනි හෙට්ටිගේ.. අප දෙසැම්බරයේදී ශ්‍රී ලංකාවේදී අතිනත ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා..

**ශ්‍රීනාත්**
මම දන්නවා ඔබ හැදෑරුවේ බිස්නස් සිස්ටම්ස් උපාධියක්.. ඇයත් ඒ ක්ෂෙත්‍රයේමද?
**කළිඳු**
නෑ. ඇය හැදෑරුවේ රේඩියෝලොජි උපාධියක්.. ඇය ප්‍රථම උපාධිය අවසන් කර වැඩිදුරටත් අධ්‍යාපනයේ නිරත වෙනවා..

**ශ්‍රීනාත්**
ඔබේ ගායනා දිවිය අමතක කරන්න එපා.. එයත් වැඩිදියුනු කරගන්නා ගමන් අනෙක් වැඩ කටයුතුත් ඉදිරියටම කරගෙන යන්න කියලා සන්නස වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.. ඒ එක්කම ඔබ සංවිධානය කරන ප්‍රසංගය මෙල්බන් වෙසෙන රසික රසිකාවියන්ට අලුත් අත්දැකීමක් වේවායි අපි ප්‍රාර්ථනා කරනවා.




